නින්දවූර් ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නින්දවූර් ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට නින්දවූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අනවසර ඉදිකිරීම සඳහා පනවන ලද දඩ මුදල් රු.190,240 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	පනවන ලද දඩ මුදල් ප්‍රමාණය එය ගෙවන අවස්ථාවේදී ගිණුම් ගත කරන අතර, පනවන ලද දඩ මුදල් නොගෙවන විට ඒ සඳහා නීතියානුකූලව කටයුතු කරනු ලබන බව.	වර්ෂයට අදාල ආදායම අදාල වර්ෂයේදීම දැක්විය යුතුය.
(ආ)	2021 වර්ෂයේදී සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පරිත්‍යාග වශයෙන් ලැබුණු භාණ්ඩ අයිතම් 07 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.	පරිත්‍යාග වශයෙන් ලැබුණු වත්කම් සම්බන්ධයෙන් තොරතුරු නොලැබීම හේතුවනි. 2024 අවසන් ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	පරිත්‍යාග වශයෙන් ලැබුණු භාණ්ඩ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් වශයේ දැක්වීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.147,564,254 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම් 06 ක් තහවුරු වන අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	අදාල ලියවිලි අපසතුව ඇති අතර, ප්‍රමාද දෝශයකින් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව.	අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය	සභා බල ප්‍රදේශයේ තිබෙන රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි සහ ඉඩම් තක්සේරු කර වරිපනම් බදු අයකිරීම සඳහා සභා විසින් කටයුතු කර නොතිබුණි.	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතනවලට අයත් ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර වරිපනම් අයකිරීම දැනට සිදුවෙමින් පවතින බව.	ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන ප්‍රකාරව වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මුල්‍ය හා පරිපාලන රීති			
	(i) 81 රීතිය	එක් එක් කාර්තුව අවසානයේදී ඉඩම් ගනුදෙනු සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් රෙජිස්ට්‍රාර් ජෙනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධ විස්තර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළද, එම කාර්යාලයේ ප්‍රමාදයන් සිදුවී ඇති බව.	මූල්‍ය, පරිපාලන රීති අනුව මුද්දර ගාස්තු අදාල කාලයදි ප්‍රතිපූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii) 218 රීතිය	බලප්‍රදේශයේ සියලුම ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි.	සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ සිදු කිරීමට කටයුතු නාගරික සංවර්ධන අධිකාරි සමග සම්බන්ධවී සිදු කිරීමට කටයුතු කරනු ලබන බව.	මූල්‍ය, පරිපාලන රීති ප්‍රකාරව ඉඩම්, ගොඩනැගිලි සමීක්ෂණයක් පැවත්වීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 880	ඇප තැබියයුතු මුදල් හා ගබඩා භාරව කටයුතු කරන සම්බන්ධ නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මුදල් හා ගබඩා සම්බන්ධ නිලධාරීන් ඇප තැබීමට ඉදිරිපත් නොවීමෙන්, රාජකාරි ලැයිස්තු අනුව රාජකාරි පවරා දෛනිකව පරික්ෂා කරනු ලැබේ. දැනට ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව.	මුදල් රෙගුලාසි අනුව, මුදල් හා ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.32,188,868 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.86,270,197 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ලබා දී ඇති තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.	ඇස්තමේන්තු ගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.
(i)	වරිපනම් හා බදු	11,450,000	79,480,622	10,334,719	69,145,903	4,033,809	64,540,592	327,486	65,300,215
(ii)	කුලී	7,947,000	11,002,153	7,778,688	3,198,466	3,198,466	7,952,405	7,952,405	3,198,466
(iii)	බලපත්‍ර ගාස්තු	1,700,000	1,404,950	1,404,950	-	1,262,250	1,262,250	1,262,250	-
(iv)	වෙනත් ආදායම්	948,000	1,668,362	1,668,362	-	7,931,292	29,126,048	29,126,048	7,931,292
	එකතුව	22,045,000	93,556,087	21,186,719	72,344,369	16,425,817	102,881,295	38,668,189	76,429,973

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන පිළිබඳ නිරීක්ෂයන් පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
(අ)	දේපළ බදු ඇස්තමේන්තු කිරීම් සම්පූර්ණව හා නිවැරදිව පිළියෙල කිරීමට සභාව විසින් කටයුතු නොකිරීම නිසා බදු දේපළ 14,572 ක් සඳහා 2024 වර්ෂයේ ඇස්තමේන්තු කරන ලද ආදායම රු.9,000,000 ක් වූ අතර බදු දේපළ 1705 ක් සඳහා රු.6,234,177 ක් පමණක් අයකර තිබුණි.	CAT 2020 Software බදු ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කිරීමට හැකිව ඇත. තවද, මෙම හිඟ බදු ආදායම් අය කිරීම සඳහා අතිරේක නිලධාරීන් යොදවා ඇති බව.	අයවිය යුතු හිඟ බදු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ හිඟ බදු ආදායම් රු.2,765,823 ක් විය. එසේ වුවද, බදු ආදායම් අයකිරීම් සඳහා	ආදායම් අංශය මගින් ඉකුත් කාලවලට අදාල හිඟ බදු අයකර ගැනීම සඳහා,	අයවිය යුතු හිඟ බදු ආදායම් කඩිනමින් අයකර ගැනීමට

	නිලධාරීන් 06 දෙනෙකු යොදවා තිබුණද, ඔවුන් වෙත ආදායම් ඉලක්ක ලබාදී තිබුණි.	කොට්ඨාස සහ ග්‍රාම සේවා වසම් අනුව වෙන්කර අදාල නිලධාරීන් වෙත රාජකාරී පවරා දී දැනට ආදායම් අයකිරීමේ කටයුතු සිදු කරනු ලබන බව.	කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව විසින් 2010 වර්ෂයෙන් පසු වරිපනම් බදු සඳහා නව තක්සේරු ලබා ගැනීමකින් තොරව, පැරණි තක්සේරුව මත මහ වීදියේ කඩ කාමර 250 කින් පමණක් වරිපනම් බදු අයකර ඇති බව නිරීක්ෂණ විය.	අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	නියමිත කාලවලදී නව තක්සේරුවක් සිදුකර ඒ අනුව ආදායම් රැස්කීරමට කටයුතු කළ යුතුය.
(ඈ)	2018 වර්ෂයේ සිට 2024 දක්වා කඩ කාමර 15 සිට 20 දක්වා ප්‍රමාණයක් බදු දීමට කටයුතු නොකිරීම නිසා සභාවට රු.1,495,200 ක ආදායමක් අහිමිවී තිබුණි.	කඩ කාමර බදු ගැනීම සඳහා කිසිවෙකු ඉදිරිපත් වී නොමැත. කෙසේවුවත්, අනාගතේදී එම කඩ කාමර බදු දීමට හෝ වෙනත් අවශ්‍ය ආයතනවලට ලබා දීමට කටයුතු කරන බව.	සුදුසු පරිදි බදු දීමට කටයුතු කළ යුතුය.
(ඉ)	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව එක් එක් කාර්තු අවසානයේ ඉඩම් ගනුදෙනු සම්බන්ධ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජෙනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් 2024 වර්ෂයේ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අවශ්‍ය විස්තර ඉදිරිපත් කිරීමෙන් පසු අදාල වර්ෂයේ මුද්දර ගාස්තු ඉල්ලුම් කර, එය දැනට ලැබෙමින් පවතින බව.	මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් රෙජිස්ට්‍රාර් ජෙනරාල් වෙත යැවීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	සමාලෝචිත වර්ෂයේ උත්සව ශාලාව බදු දීම වෙනුවෙන්	මේ සම්බන්ධයෙන් ඉදිරි මාසය සිට සභාවේ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු	මහජනයා විසින් ප්‍රයෝජනයට

	රු.256,439 ක් අයකර ගෙන තිබුණද, බදු දීමට ප්‍රථම ඇප තැන්පතු ලබා නොගැනීම හේතුවෙන් එහි තිබෙන භාණ්ඩ, හානියට පත්වූවහොත්, එම හානි පූර්ණය කර ගැනීමට නොහැකිවී තිබුණි.	කරනු ලබන බව.	ගන්නා සභාවේ වත්කම් සඳහා ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	විදුලි උපකරණ නිකුත් කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් රු.2,000,000 ක් වටිනා විදුලි උපකරණ මිලදී ගෙන බෙදාහැර තිබුණි.	මේ සම්බන්ධයෙන් තොරතුරු පරිගණක මෘදුකාංග පිටපත් ලබා ගෙන පරීක්ෂා කර ලේඛන ගත කිරීම් සිදු කරන අතර, ඒ සඳහා වෙනම ලේඛණයක්ද නඩත්තු කරනු ලබන බව.	විදුලි උපකරණ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.
(ඇ)	මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු විදුලි ගාස්තු රු.2,477,321 ක් සහ ගෙවිය යුතු විදුලි ගාස්තු රු. 2,951,150 ක් වත්කම් හා වගකීම් යටතේ දීර්ඝ කාලයක් සිට නිරවුල් කිරීමකින් තොරව දක්වා තිබුණි.	මෙම මුදල විදුලි බල මණ්ඩලය ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මකවූ කාලයට අදාල හිඟ මුදල්ය. ඉදිරියේදී සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරනු ලබන බව.	ලැබිය යුතු සහ ගෙවියයුතු මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් යටතේ ඇති රු.77,500 ක් ප්‍රතිස්ථාපන වෙන්කිරීම් දීර්ඝ කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් අවශ්‍ය කටයුතු කරනු ඇති බව.	ප්‍රතිපාදන වෙන්කිරීම් අදාල කටයුතු සඳහා යොදවා ගත යුතුය.
(ඉ)	2020 වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමෙන් රු.5,453,970 ක් පළාත් පාලන කොමසාරිස් විසින් 2021 වර්ෂයේ තාවකාලිකව රඳවා ගෙන තිබුණි. මෙම මුදල නැවත ලබා ගැනීම සඳහා ලේකම් විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් නොයකුත් අවස්ථාවල ඉල්ලුම් කළද, මෙතෙක් ලබා ගැනීමට නොහැකි වූ බව.	මුද්දර ගාස්තු ආදායම සම්පූර්ණයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 නිෂ්කාර්ය වත්කම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ අයිස් නිෂ්පාදන කිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සඳහා රු. 3,575,000 ක් සහ රු. 14,000,000 ක් වටිනා ගොඩනැගිලි ඉදිරිකර තිබුණද, 2025 වර්ෂයේ මැද භාගය දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ ඉදි කරන ලද ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව.	ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ අදාල අරමුණ සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 11 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව.	වාහන සභාව නමින් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.
(ආ)	සභාව සතු වාහන 14 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට වසර 05 ක වැඩි කාලයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	අළුත්වැඩියා කළ නොහැකි වාහන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (නැ.ප) මගින් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	අළුත්වැඩියා කළ හැකි වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හා අනෙකුත් වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව විසින් නඩත්තු කරන වාහන 06 ක් 2025 වර්ෂය වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව.	ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2022 භාණ්ඩ සමීක්ෂණයේදී විකිණීම හෝ අළුත්වැඩියා කිරීම ලෙස සටහන් කර ඇති ට්‍රැක්ටර් ටේලරය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන අවශ්‍ය කටයුතු කරනු ලබන බව.	භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ නින්දවූර් පෙර පාසල් ගොඩනැගිල්ලේ ඉටු නොකළ වැඩ කොටසක් වන අයිතම් අංක E – 05 යටතේ දක්වා ඇති inter locking block ඇතිරීම සඳහා රු.162,313 ක් නිර්දේශ කර ගෙවීම් කර තිබුණි.	වැඩිපුර ගෙවා ඇති බව සඳහන් කර ඇති මෙම වැඩ කොටස නිම කිරීම සඳහා ඉන්ටලොක් ගල් ඇල්ලීමේදී, පෙර පාසලේ ඉල්ලීම් පරිදි ක්‍රීඩා උපකරණ සවි කිරීමට අවශ්‍ය ඉඩකඩ අතහැර, අවශ්‍ය සුදුසු ස්ථානයක ඇතිරීම සඳහා තබා ඇති බව.	වැඩිපුර ගෙවීම් කර ඇති මුදල අයකිරීමට කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	සභාව සතු වාහන 07 ක් තිබුණු අතර, ඒ සඳහා රියදුරු 03 දෙනෙක් පමණක් සේවයේ යොදවා තිබුණි.	පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දැනුම්දී ඇතත්, එය මෙතෙක් ඉටුවී නොතිබුණු බව.	සේවක පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ආ)	අයවිය යුතු හිඟ ණය රු. 32,620ක් අදාල නිලධාරීන්ගෙන් හෝ ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාල නිලධාරීන්ගෙන් හෝ ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	හිඟ සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරින්ත 04 දෙනෙකු පත්කර තිබුණද, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය සහ මු.රෙ. 133 සහ 134 අනුව අභ්‍යන්තර විගණනයක් මගින් අස්ථිත්වයේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාකාරිත්වය නගාලීම සඳහා නිර්දේශ සකස්කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය පිළිපැදීමට සහ වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව.	අභ්‍යන්තර විගණනය මගින් අස්ථිත්වයේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ නගාලීම සඳහා කටයුතු කළ යුතුය.

4.2 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ආදායම් රු.192,750 ක් ලබා ගෙන තිබුණද, ආයතන 22 කින් වර්ෂ 10 ක කාලයක සිට බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	අදාල ආයතන සම්බන්ධයෙන් තොරතුරු ලබා ගෙන යාවත්කාලීන කිරීමට කටයතු කරනු ලබන බව.	බලපත්‍ර අළුත් කිරීම නිසි පරිදි සිදු කළ යුතුය.

4.3 තිරසාර සංවධර්න ඉලක්ක

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම සහ අරමුණු ලඟා කර ගැනීමට අවශ්‍ය දර්ශකයන් හඳුනා ගෙන නොතිබුණු අතර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් වෙන් කිරීමට ද කටයුතු කර නොතිබුණි.	ඉදිරි වසර සඳහා පිළියෙල කරන අයවැය ලේඛනයේ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීම සහ ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය.

4.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
(අ)	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා රු.4,980,969 ක වියදමින් අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණද, එය 2025 වර්සයේ මැද භාගය වන විටත් නිෂ්කාර්යව පැවතුණි.	අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමට අවශ්‍ය අනෙකුත් පහසුකම් සැපයිය යුතු අතර, සභා බලප්‍රදේශයේ රැස් කරන ඝණ අප ද්‍රව්‍ය වර්ගීකරණය කර භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව.	අදාල මධ්‍යස්ථානය අරමුණ සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අධීක්ෂණ නිලධාරීන් දෙදෙනෙක් යොදවා ඇතත්, ක්ෂේත්‍ර තත්ත්ව සටහන් ලේඛනය, ඉදිරි වැඩසටහන්, කොට්ඨාශයේ අසාමාන්‍ය ක්‍රියාකාරකම් සටහන් කිරීමේ ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි.	අදාල නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව.	අධීක්ෂණ නිළධාරීන්ගෙන් යොමුගත ලේඛන හා වැඩසටහන් සම්පූර්ණ කරවාගෙන ඒ පිළිබඳ පසුවිපරම් කළ යුතුය.